www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදය සහ ග්‍රීක නය අර්බුදය

## Socialism and the Greek debt crisis

2010 පෙබරවාරි 18

යුරෝපා ජනගහනයේ පුලුල් කොටසකගේ ජීවන තත්ත්වයන් මත එල්ල කිරීමට නියමිත රුදුරු ප්‍රහාර උරගා බලන තැනක් බවට ග්‍රීසිය පත්ව ඇත. ආර්ථික අර්බුදය ද බැංකු බේරා ගැනීමේ වැඩසටහන් ද නිසා යුරෝපා සංගමයේ සාමාජික රාජ්‍යවල අයවැය දැදුරු කරමින් නිර්මානය වී ඇති දැවැන්ත හිදැස් දැන් පුරවන්නට යන්නේ කම්කරු පන්තියේ වියදමිනි.

පෙබරවාරි 16 දා පැවති රැස්වීමේ දී ග්‍රීක ආන්ඩුවට ඡන්ද බලය (පූර්න සාමාජිකත්වය) අහිමි කල යුරෝපා සංගමයේ මුදල් ඇමතිවරු, එරට අයවැය යුරෝපා සංගමයේ සියුම් පරීක්ෂාවට ලක් විය යුතු බවට නියම කලහ. සාමාජික රාජ්‍යයකට ඒ හැටියෙන් සැලකීමක් යුරෝපා සංගම් ඉතිහාසය තුල මින් පෙර කිසි කලෙකත් සිදු වී නැත. දැන් ඇතන්ස් ආන්ඩුවේ සියලු ගනුදෙනු බ්‍රසල්ස්හි දී සියුම් පරීක්ෂාවට ලක් කෙරෙනු ඇත. ජාතික පාර්ලිමේන්තුව තුල දී දෙන සෑම ඡන්දයක් ම සමීපව නිරීක්ෂනය කෙරෙනු ඇත. බ්‍රසල්ස් කොමිසම තුල ද යුරෝපා මහ බැංකුව තුල ද සිටින මහජන ඡන්දයෙන් තේරී පත් නොවුනු නිලධාරීහු, මුලු රටක ම පාලනය අත්පත් කර ගනිමින් සිටිති, තම කොන්දේසිවලට අනුව කටයුතු කරන ලෙස එරට ආන්ඩුවට සහ පාර්ලිමේන්තුවට අන කරමින් සිටිති.

ග්‍රීක ආන්ඩුව සීමා පැනවීමේ සිය පිලිවෙත්වල සාර්ථකත්වය පිලිබඳ පලමු වාර්තාව සති හතරක් තරම් සුලු කාලයක දී යුරෝපා සංගමයට සහ යුරෝපා මහ බැංකුවට ඉදිරිපත් කල යුතු ය. ඒවා නොසෑහෙන්නේ යැයි සැලකුනහොත්, තවත් සීමා පැනවීම් පිලිගැනීමට ග්‍රීසියට බල කිරීම සඳහා  බහුතර ඡන්ද සංඛ්‍යාවක් ලබා දෙන්නැයි යුරෝ කලාපයට අයත් අනෙක් රටවල් පහලොවෙන් ඉල්ලා සිටිනු ඇත. දැන් සාකච්ඡාවට ලක් වෙමින් පවතින්නේ ප්‍රතික්‍රමන බද්දක් වන අගය එකතු කල බද්ද (වැට් බද්ද) වැඩි කිරීම සහ අතිරේක වැය කප්පාදු ඇතුලු පියවරයන් ගැන ය.

කප්පාදු කිරීම් සඳහා තල්ලුව සැපයෙන්නේ යුරෝපා සංගමයේ ද යුරෝපයේ විශාලතම ආර්ථිකය වන ජර්මනියේ ද පිලිවෙත් තීන්දු කරන බලගතු මූල්‍ය ආයතනවල අවශ්‍යතාවලිනි. ග්‍රීක ආන්ඩුව ඒ වන විටත් පිලිගෙන තිබුනු කප්පාදු පිලිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා ඊට කාලය ලබා දීමට යුරෝපා සංගමයේ බොහෝ සාමාජිකයන්ට වුවමනා කලත්, වියදම් කප්පාදුව වහා ම දැඩි කල යුතු යැයි ජර්මනිය, ඕස්ට්‍රියාව සහ ස්වීඩනය තරයේ කියා සිටියේ ය. ජර්මානු මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම් ජෝර්ජ් ඇස්මියුසන් කතා කලේ, රාජ්‍ය අංශයේ වැටුප පිලිවෙලින් සියයට 20කින් සහ 15කින් අඩු කර ඇති ලැට්වියාව සහ අයර්ලන්තය උදාහරන ලෙස ගෙන හැර පාමිනි.

මෙම පියවරයන්හි ඉලක්කය වන්නේ, ජනගහනයේ පුලුල් කොටසකගේ ජීවන තත්ත්වයන් දැඩි ලෙස කප්පාදු කිරීම යි. ජර්මානු අයිෆෝ ආයතනයේ ප්‍රධානියා වන හැන්ස්-වර්නර් සින් ට අනුව ''ග්‍රීකයන් සුව පහසු ජීවිතයට ඇබ්බැහි වී සිටියි." දැන් ඔවුන් "සකසුරුවම් සහගත පටිපාටියකට යටත් විය" යුතු ය. එනම්, " කොතරම් අසීරු වුව ද මූර්ත වැටුප පහත හෙලන්නට ග්‍රීකයන්ට සිදු වී ඇත." මෙය සිදු වීමට යන්නේ, දැනටමත් ග්‍රීසියෙහි ජාතික වැටුපේ සාමාන්‍යය ජර්මනියෙහි ජාතික වැටුපේ සාමාන්‍යයෙන් අඩක මට්ටමේ ද භාන්ඩ මිල ගනන් ජර්මනියෙහි භාන්ඩ මිල ගනන්වලට බෙහෙවින් ම සමාන වන තතු යටතේ ය.

දැඩි සීමා පැනවීමේ පිලිවෙත් ක්‍රියාත්මක කරන ලෙස ඇතන්ස් ආන්ඩුවට අන කිරීමෙන් පෙනී යන්නේ යුරෝපා සංගමයට අයත් රාජ්‍යයන් අතර පැවති සබඳතාවල මූලික වෙනසක් සිදු වී ඇති බව යි. කලාපීය රටවල් අතර පවතින වෙනස්කම් ඌනපූරනය කිරීම සඳහා අනෙක් රටවලට සාපේක්ෂව විශාල මුදලක් යුරෝපා සංගම් අයවැයට ගෙවා ඇති බැවින් ජර්මනිය, යුරෝපයේ ''ගෙවුම් නිලධාරියා" යැයි දිගු කාලයක් තිස්සේ සැලකින. මෙම ගෙවීම් යුරෝපා සංගමය පුලුල් කිරීමටත් ශක්තිමත් කිරීමටත් ප්‍රයෝජනවත් වු නමුත්, පසුව ඒවායින් ඉහල ම ප්‍රතිලාභ ලබා ගත්තේ ද ජර්මානු ආර්ථිකය යි. බ්‍රසල්ස් හා බර්ලිනය, ග්‍රීක ප්‍රභූ පැලැන්තියේ දූෂන නොදැක්කාක් සේ සිටියේ, ග්‍රීක වෙලඳ පොල අත්පත් කර ගැනීම සඳහා මහ සංගතවලට සහ බැංකුවලට ඉන් ඉඩ සැලසෙන බැවිනි. දැන් කම්කරු පන්තිය මත දරුනු ප්‍රහාරයන් පැටවීම සඳහා ව්‍යාජ හේතුවක් ලෙස යොදා ගැනෙන්නේ ද එම දූෂන යි.

එහෙත් "ගෙවුම් නිලධාරියාගේ" භූමිකාව තව දුරටත් රඟපාන්නට දැන් බර්ලිනය කැමත්තක් නොදක්වයි. ග්‍රීක ආන්ඩුවට මූල්‍ය සහාය ලබා දීමට ඉදිරිපත් වූ

සියලු යෝජනාවලට මර්කල් ආන්ඩුව විරුද්ධ විය. ග්‍රීක අර්බුදය "ගෙදර ප්‍රශ්නයක්" බවට කෙරෙන ප්‍රචාරයෙන් ජර්මානු මාධ්‍ය පිරී ඇත. ඒවායින් කියැවෙන පරිදි අර්බුදය ඇති වූයේ ග්‍රීකයන් "තම අතමිට තිබුනු පමනට වැඩියෙන් ජීවත් වුනු'' බැවිනි. ජර්මානු ධනේශ්වරයට ග්‍රීක නය එතරම් ම ගැටලුවක් නො වේ. එය සැලකිලිමත් වන්නේ අර්බුදයේ මිල කම්කරු පන්තිය විසින් ගෙවිය යුතු ය යන මූලධර්මය ගැන යි. ග්‍රීසියෙහි කම්කරු පන්තිය සම්බන්ධයෙන් පමනක් නො ව, යුරෝපය පුරා ද මර්කල් ආන්ඩුව නිර්ධය සීමාකිරීම් සූදානම් කිරීමෙහි යෙදී සිටින ජර්මනියේ කම්කරු පන්තිය සම්බන්ධයෙන් ද මෙය සත්‍යයකි.

ජර්මනියේ ආක්‍රමනශීලී ක්‍රියා නිසා යුරෝපා සංගමය තුල පවතින ගැටුම් වඩා නරක අතට හැරෙමින් ද යුරෝපා ආයතන පිපිරී යාමේ තර්ජනය ද මතු වී ඇත.

ජනගහනයේ පුලුල් කොටසකගේ ජීවන තත්ත්වයන් මත එල්ල කිරීමට නියමිත ප්‍රහාරයේ දී යුරෝපා සංගමයට, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් කෙරෙහි බලාපොරොත්තු තබා ගත හැකි ය. ස්පාඤ්ඤයේ සහ පෘතුගාලයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු දැවැන්ත කප්පාදු වැඩ සටහන් පිලිගනිමින් සිටී. ග්‍රීසියෙහි ජියෝගොස් පැපැන්ඩ්‍රියෝගේ පැසොක් (PASOK) ආන්ඩුව පසු ගිය වසරේ දී මැතිවරනය දිනා ගත්තේ, කොස්ටාස් කරමන්ලිස්ගේ කොන්සර්වැටිව් (තත්ත්වාරක්ෂක) ආන්ඩුව කෙරෙහි පැවති දැවැන්ත අතෘප්තියට ද ගනන් නැති ජනතාවාදී පොරොන්දුවලට ද පින් සිදු වන්නට ය. තනතුරේ වැඩ භාර ගත් වහා ම මැතිවරන ව්‍යාපාරයේදී දුන් පොරොන්දු වලට පයින් ගසමින් පැපැන්ඩ්‍රියෝ, රැකියා, වැටුප් කප්පාදු, විශ්‍රාම යන වයස් සීමාව ඉහල දැමීම සහ ඒ හා සමාන වෙනත් පියවරයන් ඇතුලු කම්කරු පන්තියේ ජීවන තත්ත්වයන් දැඩි ලෙස කප්පාදු කරන පියවරයන් හඳුන්වා දුන්නේ ය.

සියලු විරුද්ධතාවන් හමුවේ, තමන් මෙම පිලිවෙත ක්‍රියාවට නඟන බව බැංකුකරුවන්ට සහ ආන්ඩුවේ නියෝජිතයන්ට ඒත්තු ගැන්වීම සඳහා පැපැන්ඩ්‍රියෝ ද ඔහුගේ මුදල් ඇමති ජෝර්ජ් පපාකොන්ස්ටන්ටිනෝ ද යුරෝපය පුරා සංචාරය කර ඇත. එහෙත්, යුරෝපා සංගමයේ කොමසාරිස් ඔල්ලී රෙහ්න් පවසන පරිදි, එම පිලිවෙත ඇති තරම් දුර යන්නක් නො වේ. "මෙම වසරේ කපා හැරීමේ ඉලක්ක සපුරා ගනු පිනිස, ග්‍රීසියට මාර්තු මස මැද දී අතිරේක පියවරයන් යෝජනා කිරීමට සිදු වනු ඇතැ"යි ඔහු කී ය.

කම්කරු පන්තියට එරෙහි ප්‍රහාර ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, යුරෝපා සංගමය පැපැන්ඩ්‍රියෝ කෙරෙහි ද පැපැන්ඩ්‍රියෝ වෘත්තීය සමිති කෙරෙහි ද බලාපොරොත්තු තබා ගෙන සිටී. සීමා පානවීම් වලට එරෙහි විරෝධය වර්ධනය වෙමින් පවතී. පෙබරවාරි 9 සහ 10 දා රාජ්‍ය අංශයේ කම්කරුවෝ වර්ජනයක යෙදුනහ, පෙබරවාරි 24 දා එක් දින මහා වර්ජනයක යෙදීමට සැලසුම් සැකසෙමින් පවතියි. එහෙත් වෘත්තීය සමිති කරමින් සිටින්නේ විරෝධතාවන් හුදෙකලා ක්‍රියාවන් බවට පිරිහෙළීම යි. ඔවුන් දකින පරිදි ඔවුන්ගේ කර්තව්‍යය වන්නේ, ප්‍රතිරෝධය පාලනයට නතු කර ගත හැකි වනු පිනිස සහ ආන්ඩුව බැරෑරුම් ගැටලුවකට පත් නොවන බව සහතික කර ගත හැකි වනු පිනිස උනුසුම වාෂ්පකර හරීමයි.

කේකේඊයේ (ග්‍රීක කොමියුනිස්ට් පක්ෂයේ) සහ සිරිසා (SYRIZA) සන්ධානයේ පටන් ගිනිය නොහැකි තරම් වන කුඩා පක්ෂ දක්වා වූ ''වාමාංශික'' යයි කියාගන්නා බොහෝ සංවිධාන ඔවුන්ට සහාය දෙයි. පැහැදිලිවම මෙම පක්ෂවල අවස්ථාවාදී වූත්, ජාතිකවාදී වූත්, දිශානතිය නිසා ඒවා සියල්ලට එකතු විය හැකිව තිබේ. ඒවා එක්කෝ පැසොක් ආන්ඩුව වටේ කැරකෙයි, නැත් නම් ඊට බලපෑම් යෙදීමට උත්සාහ කරයි.

එහෙත් ග්‍රීක අර්බුදයට ජාතිකවාදී විසඳුමක් නැත. යුරෝපා සංගමය සොරතර අවසන් නිවේදනයක් අතැතිව එරට අබිමුවෙහි පෙනී සිටියිඃ එනම්, එයට එක්කෝ බ්‍රසල්ස් අන කරන සීමා කිරීම් කර පින්නා ගෙන යුරෝ මුදල දිගට ම පවත්වා ගත හැකි ය, නැත් නම් එයට ග්‍රීක ව්‍යවහාර මුදලේ පිරිහීමකට බොහෝ දුරට මග පෑදිය හැකි පියවරක් වන යුරෝ කලාපයෙන් ඉවත් වීම පිලිගත හැකි ය.

යුරෝපා සංගමය අන කරන සීමා පැනවීමෙන්, යුරෝපය පුරා දරුනු පන්ති ගැටුම්. න්‍යාය පත්‍රයට ඇතුල් කර තිබේ. මූල්‍ය ප්‍රභුව සීමාන්තික ලෙස ධනය ගොඩ ගසා ගනිමින් සිටිද්දී, උග්‍ර කප්පාදු පිලිගැනීමට කැමති වන ජන සංඛ්‍යාව වඩ වඩාත් පහත වැටෙමින් තිබේ.

කම්කරු පන්තියට ජාත්‍යන්තර දේශපාලන මූලෝපායක් අවශ්‍ය ය. ග්‍රීක කම්කරුවන් යුරෝපා කම්කරු පන්තිය දෙසට හැරිය යුතු ය, එමෙන්ම ඇතන්ස් සහ බ්‍රසල්ස් වෙතින් පැටවෙන සීමාවන්ට එරෙහිව ග්‍රීක කම්කරුවන් ගෙන යන අරගලයේ දී යුරෝපා කම්කරු පන්තිය ඔවුන්ට සහාය දිය යුතු ය.

ජාතික විරෝධතාවලින් හා ජාතික ආන්ඩුවලට බලපෑම් දැමීමෙන් යුරෝපා සංගමය එල්ල කරන ප්‍රහාර නවතා ලිය නොහැකි ය. ඒ සඳහා සමාජය සමාජවාදීව ප්‍රතිසංවිධානය කිරීම ඉලක්ක කොට ගෙන යුරෝපා කම්කරු පන්තියෙන් එල්ල කෙරෙන දේශපාලන ප්‍රහාරයක් අවශ්‍ය ය. ආර්ථික ජීවිතයේ පදනම හැඩ ගැසී ආ යුත්තේ බ්‍රසල්ස් පිලිවෙත් තීරනය කරන මූල්‍ය සහ කාර්මික සංගතවල ලාභ අවශ්‍යතාවලින් නො ව සමාජයේ සාමාජික අවශ්‍යතාවලිනි. බැංකුවල සහ සංගතවල යුරෝපා සංගමය වෙනුවට, යුරෝපා සමාජවාදී එක්සත් ජනපදයක් ආදේශ විය යුතු ය.

**පීටර් ෂ්වාර්ස්**



© www.wsws.org